# සිංහල ජනශ්‍රැතිය පෝෂණයෙහිලා සංස්කෘත සාහිත්‍යයෙහි බලපෑම: විමර්ශනාත්මක අධ්‍යයනයක්

The influence of the Sanskrit Literature in Enriching Sinhala Folklore: An Investigative Study

**කරඳගොල්ලේ සෝභිත හිමි**

---

**Abstract**

The People living in different societies have acquired vast learning as a result of the gift of knowledge from their elders. The knowledge that those elderly people have inherited from oral generation is innate in its creative quality. That path of knowledge is known as folklore. The Proverbs, similes and idioms can be identified in the study of Sinhala folklore. Throughout that folklore, it can identify a lot of information of life styles and social existence of those who lived and are still living in the community. There is no doubt that stories and statements contained in literature and events related to people who speak different languages were helpful in creating those statements that come in folklore. Especially, it can be seen in the analysis that the Sanskrit language and literature have made an impaction the development of the Sinhala language and literature and the didactic stories and statements contained in the books written in the Sanskrit language have been helpful in the creation of proverbs, similes and idioms belonging to the Sinhala folklore. Therefore, it is need of the hour to make a study on it. Therefore, this study is conducted by comparing the incidents and statements of the stories in the books of Pañcatantra and Hitopadeśa, famous books of Sanskrit didactic literature and the

Ślokas of Pratya Śataka, with statements and stories mentioned in the Sinhala folklore.

**Keywords:-** Proverbs, Similes and Idioms, Pañcatantra, Hitopadeśa, Pratya Śataka, Sinhala folklore

**හැඳින්වීම**

විවිධ ජන සමාජයන්හි වෙසෙන ජනයා ඇසු පිරූ තැන් ඇති බවට පත්වූයේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨයන්ගෙන් ලත් ඥාන දායාදයේ ප්‍රතිඵලයක් වශයෙනි. එම වැඩිහිටි ජනතාව වාචෝද්ගතව පරපුරෙන් පරපුරට උරුම කරදුන් එම ඥානය නිර්මාණාත්මක ගුණයෙන් අනූන වූවකි. එම ඥාන මාර්ගය අපර නාමයකින් ජනශ්‍රැතිය (folklore) නමින් හඳුන්වනු ලබයි (සුනන්ද, 2000: vii). සිංහල ජනශ්‍රැතිය පිළිබඳ විමසීමේදී ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟි වැකි හඳුනාගත හැකිය. එමගින් ජන සමාජයේ ජීවත් වූ සහ ජීවත් වන්නවුන්ගේ ජීවන තොරතුරු රාශියක් හඳුනාගත හැකිවෙයි. ජන වහරේ එන එම ප්‍රකාශයන් නිර්මාණය කරගැනීමෙහි ලා විවිධ භාෂාවන් කථා කරන ජන කොට්ඨාශයන්ට අයත් සිදුවීම් හා සාහිත්‍යයන්හි අන්තර්ගත කථාන්දර හා ප්‍රකාශයන් ඉවහල් වූවාට සැකයක් නැත.

විශේෂයෙන් සිංහල භාෂාව සහ සාහිත්‍යය පෝෂණයෙහිලා සංස්කෘත භාෂාව හා සාහිත්‍යය බලපෑවාක් මෙන්ම සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථයන්හි අන්තර්ගත උපදේශාත්මක කථාන්දර හා ප්‍රකාශයන් සිංහල ජනශ්‍රැතියට අයත් ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟි වැකි නිර්මාණයෙහි ලා ඉවහල් වී ඇති අකාරය ඒ පිළිබඳ විග්‍රහ කර බැලීමේ දී අපට දැකගත හැකි අතර ඒ පිළිබඳ පුළුල්ව අධ්‍යයනය කිරීම කාලෝචිත ය. ඒ අනුව සංස්කෘත සාහිත්‍යයෙහි ප්‍රකට උපදේශ ග්‍රන්ථ වන විෂ්ණුශර්මන් පඬිවරයාගේ පඤ්චතන්ත්‍රය හා නාරායණ ශර්මන් පඬිවරයාගේ හිතෝපදේශය යන ග්‍රන්ථයන්හි එන උපදේශ කථාවන්ට අයත් සිදුවීම් හා ප්‍රකාශයන් මෙන්ම ප්‍රත්‍ය ශතකයෙහි ශ්ලෝක පාඨ සිංහල ජනශ්‍රැතියෙහි සඳහන් පාඨ හා කථාන්දර සමග සමන්වා බලමින් මෙම අධ්‍යයනය සිදු කෙරේ.

**යතුරු පදඃ-** හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය, ප්‍රත්‍ය ශතකය, සිංහල ජනශ්‍රැති, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟි වැකි

**පර්යේෂණ ගැටලුව**

සිංහල ජනශ්‍රැතිය පෝෂණය කිරීමෙහිලා සංස්කෘත සාහිත්‍යය බලපා තිබේ ද ? යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ අරමුණු**

මෙම පර්යේෂණයෙන් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵලය වන්නේ සංස්කෘත සාහිත්‍යය සිංහල ජනශ්‍රැතිය පෝෂණයෙහිලා බලපා ඇති ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීමයි. එමෙන්ම සංස්කෘත සාහිත්‍යයෙන් සිංහල ජනශ්‍රැති නිර්මාණයට උපයෝගී කරගෙන ඇති සිදුවීම්, කථාන්දර, ප්‍රකාශයන් හා ශ්ලෝක පාඨයන්හි දක්නට ලැබෙන සුවිශේෂී වැදගත්කම් හා එම ප්‍රකාශයන් ජනශ්‍රැති විෂය ක්ෂේත්‍රයෙහිලා උපයුක්ත කරගත හැකි විවිධ විෂය පරාශයන් පිළිබඳ අධ්‍යයනයට විද්‍යාර්ථීන් නැඹුරු කරවීමත් මෙම පර්යේෂණයේ අරමුණු අතර වේ.

**පර්යේෂණයේ වැදගත්කම**

සංස්කෘත සාහිත්‍යාගත කථාන්දර, සිදුවීම් හා ශ්ලෝක පාඨ පිළිබඳ අවබෝධය තිබූ, ඒවා කියවා හෝ විද්වතුන්ගේ මාර්ගයෙන් අසා හුරුපුරුදු පැරණි ජනයා එම අත්දැකීම් ඔස්සේ විවිධ පාඨයන් අවස්ථානුකූලව නිර්මාණය කොට සිංහල ජනශ්‍රැතිය පෝෂණයෙහිලා උපයුක්ත කොට ගෙන ඇති ආකාරය හඳුනාගත හැකි වේ. විශේෂයෙන් සංස්කෘත භාෂාව හා සාහිත්‍යය පෙරදිග අනෙකුත් භාෂාවන්ට හා සාහිත්‍යයන්ට බලපා ඇති ආකාරය පිළිබඳ පර්යේෂණයන්හි යෙදෙන පර්යේෂකයන්ට අවශ්‍ය මගපෙන්වීම් මෙවන් පර්යේෂණ මගින් සිදුකිරීමට හැකියාව ලැබේ.

**පර්යේෂණ සීමා**

මෙම පර්යේෂණයේදී සිංහල ජනශ්‍රැතිය පෝෂණය කිරීමෙහිලා සංස්කෘත සාහිත්‍යය බලපා ඇති ආකාරය නිර්ණය කිරීමෙහිලා සංස්කෘත සාහිත්‍යයෙහි ප්‍රකට උපදේශ ග්‍රන්ථ වන විෂ්ණුශර්මන් පඬිවරයාගේ පඤ්චතන්ත්‍රය හා නාරායණ ශර්මන් පඬිවරයාගේ හිතෝපදේශය යන ග්‍රන්ථ ද්වය හා ප්‍රත්‍ය ශතකය නම් ශතක ග්‍රන්ථය පරිශීලනය කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව හිතෝපදේශය හා පඤ්චතන්ත්‍රයෙහි අන්තර්ගත කථාවන්ට අයත් සිදුවීම් හා ප්‍රකාශයන්

මෙන්ම ප්‍රත්‍ය ශතකයෙහි අන්තර්ගත ඇතැම් ශ්ලෝක පාඨ සිංහල ජනශ්‍රැතියෙහි සඳහන් පාඨ හා කථාන්දර සමග සමන්වා බලමින් තොරතුරු ගවේෂණය සිදුකෙරේ. එහිලා හිතෝපදේශය හා පඤ්චතන්ත්‍ර යන කෘති සඳහා M.R.Kale මහතා විසින් සංස්කරණය කරන ලද මූලපාඨ ඇතුළත් ග්‍රන්ථ භාවිත කෙරේ.

## සාහිත්‍ය විමර්ශන

සිංහල ජනශ්‍රැතියට අයත් ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟි වැකි පිළිබඳ කරන ලද විවිධ අධ්‍යයනයන් දක්නට ලැබෙන නමුත් එම අධ්‍යයනයන් මගින් සිංහල ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟි වැකි නිර්මාණයෙහිලා සංස්කෘත සාහිත්‍යයේ බලපෑම පිළිබඳ සාකච්ඡා වී නො මැත. ඒ අනුව ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ මහතාගේ සිංහල ප්‍රස්තාව පිරුළු සාහිත්‍යය, (1995), සුනන්ද මහේන්ද්‍ර මහතාගේ ජනකියමන් පොත (2000) හා දෙනගම මංගලිකා රණසිංහ මහත්මියගේ ප්‍රස්තාව පිරුළු සහ ඉඟි වැකි (2013) යන ග්‍රන්ථයන්හි විවිධ විෂය ඔස්සේ නිර්මාණය වී ඇති සිංහල ජනශ්‍රැතියට අයත් ප්‍රස්තාව පිරුළු පිළිබඳ කරුණු ගෙන හැර දක්වයි. විශේෂයෙන් එම ජනකියමන් අතර සංස්කෘත සාහිත්‍යයේ අන්තර්ගත කථාන්දර, සිද්ධි හා ශ්ලෝක පාඨයන් ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති ජනකියමන් පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි නමුත් එම ජනකියමන් නිර්මාණය වීම සඳහා පාදක වී ඇති සංස්කෘත සාහිත්‍යාගත කථාන්දරය හෝ ශ්ලෝක පාඨය පිළිබඳ තොරතුරු සාකච්ඡා කර නොමැත. එහෙයින් මෙම අධ්‍යයනය මඟින් සංස්කෘත සාහිත්‍යාගත කථාන්දර, සිද්ධීන් හා ශ්ලෝක පාඨයන් ආශ්‍රය කොට නිර්මාණය වී ඇති සිංහල ජනශ්‍රැතියට අයත් ජනකියමන් පිළිබඳ අවබෝධය ලබාගැනීමට හැකියාව ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තේමා විශ්ලේෂණ හා සංධාර පර්යේෂණ ක්‍රමය මෙහිදී උපයුක්ත කරගනු ලැබේ. ඒ අනුව මෙම අධ්‍යයනයේදී ප්‍රාථමික මූලාශ්‍ර නිරීක්ෂණය හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය වේ. එහිලා සංස්කෘත සාහිත්‍යයෙහි එන උපදේශ කථාවන්ට අයත් සිදුවීම් හා ප්‍රකාශයන් මෙන්ම ශතක ග්‍රන්ථයන්හි අන්තර්ගත ඇතැම් ශ්ලෝක පාඨ සිංහල

ජනශ්‍රැතියෙහි සඳහන් පාඨ හා කථාන්දර සමග සමන්වා බලමින් තොරතුරු ගවේෂණය සිදුකෙරේ. එහිලා විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇති පර්යේෂණයන් ද වෙනත් ප්‍රාමාණික ද්විතීයික ශාස්ත්‍රීය අධ්‍යයනයන් ද විමර්ශනයට ලක් කෙරෙන අතර ශාස්ත්‍රීය සාකච්ඡා, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ හා දේශන ආදිය සුදුසු පරිදි උපයෝගී කරගැනීමට අපේක්‍ෂා කෙරේ.

### සාකච්ඡාව හා ප්‍රතිඵල

පුරාණ ජනයා විවිධ සාහිත්‍යයන්හි අන්තර්ගත කථාන්දර හා සිදුවීම් පිළිබඳවත් විවිධ උපදේශයන් සපයන සාහිත්‍යාගත උපදේශ පාඨයන් පිළිබඳවත් අවබෝධයකින් යුක්තව කටයුතු කරන්නට ඇත. ඒ සඳහා හොඳින් පොත කියවන ලද විවිධ භාෂා සාහිත්‍යයන්හි දැනුමැති උගතුන්ගේ ආශ්‍රයත් බහුශ්‍රැත භාවයත් තත් ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟි වැකි නිර්මාණයෙහිලා ඔවුනට පිටුබල සපයන්නට ඇති බව නොරහසකි. විශේෂයෙන් සිංහල ජනශ්‍රැතියෙහි දක්නට ලැබෙන ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟි වැකි විවිධ ප්‍රස්තුතයන් මුල්කොට ගෙන බිහි වී ඇති ආකාරය හඳුනාගත හැකිවේ. එහිලා සතුන් මුල්කොටගත් විවිධ කථාන්දර හා සිදුවීම් ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති ජනශ්‍රැතීන් රැසක් දැකගත හැකි වෙයි. ඒ අනුව සංස්කෘත උපදේශ සාහිත්‍යාගත පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ අන්තර්ගත කථාන්දර ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති බව නිගමනය කළ හැකි එවැනි ජනශ්‍රැති කිහිපයක් පහත දැක්වේ.

'බල්ලාගේ වැඩේ බූරුවා බාරගත්තා වගේ'[1] (සුනන්ද, 2000:341). 'බල්ලාගේ වැඩේ බූරුවා කළා වාගේ' (ප්‍රේමාදාස, 1995:151). 'බල්ලගෙ වැඩේ බූරුවා කරනවා වගේ' (මංගලිකා, 2013:115). මෙම ප්‍රකාශය තහවුරු කරන කථාන්දරය හිතෝපදේශයෙහි සුහෘද්භේද කාණ්ඩයෙහි දෙවන කථාවෙන් හඳුනාගත හැකිය (Kale, 1967:37). එම කථාව මෙසේයි.

''බරණැස කර්පූරපටක නම් රජකයෙක් විසීය. ඔහුගේ නිවසෙහි කොටළුවෙක් සහ බල්ලෙක් ද වෙති. දිනක් රජකයා තම තරුණ බිරිඳ සමඟ නින්දට වන් විට ගෙයි භාණ්ඩ පැහැර ගැනීම සඳහා සොරෙක් පැමිණියේය. තමාට ආහාර දීමෙහි මන්දෝත්සාහී වූ

ස්වාමියා කෙරෙහි කලකිරී සිටි බල්ලා ස්වාමියාගේ නිවසට හොරුන් පැමිණියත් නොබුරා සිටියි. බල්ලාගේ මේ පිළිවෙතට එරෙහි වන කොටළුවා එසේ නොකොට ස්වාමියාගේ යහපත උදෙසා ක්‍රියා කරන මෙන් බල්ලාට කරුණු දක්වයි. එවිට තමන්ට අයත් නැති කටයුතු පිළිබඳ නො සොයා තම පාඩුවේ සිටින ලෙස බල්ලා කොටළුවාට අවවාද කරයි. එහෙත් ස්වාමියාගේ දියුණුව පිණිස කටයුතු කිරීම යහපත් සේවකයාගේ යුතුකම බව පවසන කොටළුවා රජකයා අවදි කරවීම පිණිස ඉතා උස් හඬින් චීත්කාර ශබ්දය පවත්වයි. එයින් බිය වී සොරු පලා යන අතර වෙහෙසට පත්ව නිදාසිටින තමන්ගේ නින්දට බාධා කරන කොටළුවාගේ ශබ්දයට කේන්ති ගන්නා රජකයා නැගිට අවුත් ඔහුට පොල්ලකින් පහර දෙයි. එයින් කොටළුවා ජීවිතක්ෂයට පත්වෙයි. (Kale, 1967:37).

මෙයින් පැහැදිලි කරන්නේ වැරදි හැසිරීම පුද්ගලයාගේ විනාශය පිණිස පවතින බව යි. විශේෂයෙන් සේවකයන් නොතකා හැරීම සහ ඔවුන්ට අවශ්‍ය දෑ සුදුසු අවස්ථාවේ ලබා නොදීම නිසා මෙන්ම තමන්ට අයත් නැති කටයුතු කිරීමට යාම නිසා විවිධ කරදරයන්ට හා ගැටුම්වලට මුහුණ පෑමට සිදුවන බව උක්ත කථාවෙන් වැඩිදුරටත් විස්තර වෙයි. එබඳු සන්දර්භයන්ට අදාළව කටයුතු කිරීමේදී වඩා සැලකිලිමත් වියයුතු බව මිනිසුන්ට ඇඟවීම පිණිස උක්ත ජනකියමන නිර්මාණය වන්නට ඇත.

'ඉබ්බා අහසින් ගියා වගේ' (සුනන්ද, 2000:87), (ප්‍රේමදාස, 1995:243), (මංගලිකා, 2013:29). 'ඉබ්බා නහින්නේ කට හින්දලු', 'ඉබ්බට කට රැකගන්න බැරි උනා වගේ', 'ඉබ්බා රිටෙන් ඇරියා වගේ' (මංගලිකා, 2013:35). මෙම ප්‍රකාශය තහවුරු කරන කථාන්දරය පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද කාණ්ඩයේ දහතුන්වැනි කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකිය (Kale, 1969:66-67).

එක්තරා මහවනයක පිහිටි විලක ඉදිබුවෙක් වාසය කරයි. එම විලෙහිම වාසය කරන සංකට හා විකට නම් හංසයන් දෙදෙනෙක් ඔහු හා මිත්‍රව වාසය කරති. කලක් ගිය පසු දොළොස් අවුරුදු නියඟයකින් විල වියළී යන්නට පටන් ගත්තේය. මෙය දුටු හංසයෝ දෙදෙනා වෙනත් විලකට යන්නට තීරණය කළහ. එසේ තීරණය කොට තම මිත්‍රයා වූ ඉදිබුවාට කියා ඔහුගෙන් සමුගැනීමට ඔහු හමුවට ගියහ.

එම අවස්ථාවේ ඉදිබුවා තමන් මෙම විලෙහි වෙසුණොත් මරණයට පත්වීමට සිදුවන බැවින් තමන් ද කැටුව යන ලෙස හංසයන්ට දැන්වීය. එහෙත් එලෙස ඔහුව කැටුව යන්නේ කෙසේදැයි හංසයන් විමසු අවස්ථාවේ 'ශක්තිමත් ලී කැබැල්ලක් රැගෙන එන ලෙසත් එම ලී කැබැල්ල මැද්දෙන් මා මුවින් ඩැහැගත් කල්හි එහි දෙපැත්ත තොපගේ තුඩින් දැඩිසේ ගෙන දියෙන් පිරුණු විල බලා පියඹන්න.' යැයි ඉදිබුවා පැවසීය. එසේ කිරීම සුදුසු බව තීරණය කොට ඉදිබුවා උසුලා යන්නට පෙර 'අහසේ පියාඹා යන විට කථා නොකරන්න. කටපියාගෙන ඉන්න.' යැයි හංසයෝ දෙදෙනා ඉදිබුවාට දැඩිසේ අවවාද කළහ. ඉදිබුවා ද ඒ පිළිබඳ දිවුරුම් දෙන බව පැවසීය. ඒ අනුව ඉදිබුවා ලීයෙහි මුවින් එල්ලී සිටිද්දී තුඩගින් එහි දෙපැත්ත අල්ලාගත් හංසයෝ දෙදෙනා විලක් සොයා අහසේ පියාඹන්නට වූහ. මෙසේ යන විට එක්තරා නගරයක එළිමහනේ සිටි පිරිසක් හංසයන් දෙදෙනා විසින් ගෙනයනු ලබන ඉදිබුවා දැක 'හංසයන් විසින් උසුලාගෙන යනු ලබන රියසක්වළල්ලක් වැනි දෙය කුමක්දැයි' උස් හඬින් අසමින් කෑ ගසන්නට වන්හ. ඔවුන්ගේ එම කෝලාහලය අසා එය කුමක්දැයි අසන්නට කට අරින්ම ලීයෙන් කට මිදී ඔහු බිමට වැටිණි. එයිනික්බිති ඉදිබුවා මස්කන්නවුන්ට භෝජනයක් විය (හේමපාල, 2002:139-141), (Kale, 1969:66-67).

ඉහත කථාවට අනුව ඉදිබුවා විනාශයට පත් වන්නේ තම මිත්‍රයන් දුන් අවවාද නොතකා හැරීම නිසයි. එමෙන්ම අස්වාභාවික දෙයක් කිරීමට උත්සාහ ගැනීමත් ඉදිබුවාගේ විනාශයට හේතු විය. එම සිදුවීම මුල්කොට ගෙන සිංහල ජනශ්‍රැතිය තුළ එවැනි සන්දර්භයන්ට අදාළව අනවශ්‍ය අවස්ථාවන්හි කථා කිරීමට යාමත් අස්වාභාවික දෑ කිරීමට උත්සුකවීමත් විවිධ පීඩාවන්ට හා විනාශයට හේතු වන මිනිසුන්ට ඒත්තු ගැන්වීම සඳහා ඉදිබුවාගේ කථාව ප්‍රස්තුත කොටගත් යථෝක්ත ජනකියමන් නිර්මාණය කර ඇති බව හඳුනාගත හැකිවෙයි.

''ඇතාගෙන් කැටකිරිල්ල පළිගත්තා වාගේ'' (සුනන්ද, 2000:68), (ප්‍රේමදාස, 1995:240), (මංගලිකා, 2013:29). මෙම ප්‍රකාශය තහවුරු කරන කථාව පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද කාණ්ඩයේ පසළොස්වැනි කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකිය (Kale, 1969:69-71).

කිසියම් වනයක ගේ කුරුළු ජෝඩුවක් තමළු ගසක සාදන ලද කූඩුවක වාසය කරයි. අනතුරුව කල්යන කල්හි ඔවුන් දෙදෙනාට දරුවෙක් විය. එක් දිනක් අතිශයින් මත් වූ කිසියම් ඇතෙක් ග්‍රීෂ්මයෙන් පීඩිත වූයේ සෙවණ කැමැත්තෙන් ඒ තමළු ගස ඇසුරු කළේය. අනතුරුව මදය අධික නිසා ඒ ගසේ ගේ කුරුල්ලන් ඇසුරු කළ ඒ අත්ත සොඬ අගින් ඇඳ කැඩුවේය. ඒ අත්ත බිඳී යාමෙන් සියලු ගේ කුරුලු බිත්තර විසුරුණේය. තවද ආයුෂ ඉතිරි නිසා ගේ කුරුලු යුවළ දුකසේ පණ බේරගත්හ. ඉක්බිති ගේ කිරිල්ලී සිය බිජු බිඳීමෙන් මඩනා ලද්දී වැලපීම් කරන්නී කිසි සැපයකට නො පැමිණියාය. මේ අතර ඇයගේ මේ වැලපීම අසා ඇයගේ අති මිත්‍ර වූ කාෂ්ඨකූට නම් පක්ෂියෙක් ඒ දුකින් දුක් වූයේ නො වැලපෙන්න යැයි කීය. එවිට ඇය 'ඉදින් නුඹ මගේ සැබෑ මිතුරෙක් නම් මාගේ දුක නැති කිරීම සඳහා සිය බිජු විනාශ කළ දුෂ්ට ඇතාගේ විනාශය පිළිබඳ ක්‍රමයක් සිතන්න' යැයි කීවාය.

එවිට මම මාගේ බුද්ධි ප්‍රභාවයෙන් එම ඇතා නැසීමට කටයුතු කරමි. 'මගේ මිතුරු වූ වීණාරව නම් මැස්සියක් සිටී. ඒ දුෂ්ට ඇතා නැසීමට ඇය කැඳවාගෙන එමියි.' ගේ කුරුලු ජෝඩුවත් සමඟ මැස්සිය වෙත ගොස් සියලු පුවත් කියා ඇතා විනාශ කිරීම පිණිස සහාය වන්න යැයි කීහ. එයට එකග වූ ඇය 'මගේ යහළුවෙක් වූ මේඝනාද නම් මැඩියෙක් සිටී ඔහු ද කැඳවාගෙන සුදුසු දෙයක් කරමු. යැයි' පවසා ඔහු වෙත ගියහ. ඉන්පසු සියලුදෙනා මේඝනාද වෙත ගොස් සියලු පුවත් ඔහුට සැලකළහ. එවිට ඔහු ඇතා නැසීම සඳහා අවශ්‍ය උපාය පවසන්නේ 'මැස්සිය නුඹ ගොස් මධ්‍යහ්න වේලාවේ මදයෙන් උඩඟු වූ ඒ ඇතාගේ කණෙහි ඉතා මිහිරි ශබ්දයක් කරන්න. එයින් කුල්මත් වූ විට වැසූ නෙත් ඇත්තේ වෙයි. ඊට පසුව කාෂ්ඨකූටයාගේ තුඩගින් උපුටන ලද නෙත් ඇත්තේ අන්ධ බවට පත්වෙයි. පිපාසයට පත්ව හැසිරෙන විට අවාට තීරය ඇසුරු කළ පිරිවර සහිතව කෑ ගසන මාගේ ශබ්දය අසා ජලාශයක් යැයි සිතා එහි එළඹේ ද වලට වැටී මරණයට පත්වන්නේ යැයි.' කීය. අනතුරුව එසේ කළ කල්හි ඒ මත් ඇතා මැස්සියගේ ගී හඬෙහි සැපයෙන් වසන ලද නෙත් ඇත්තේ කාෂ්ඨකූට විසින් උපුටන ලද නෙත් ඇතිව මධ්‍යහ්න වේලාවෙහි හැසිරෙන්නේ මැඩියන්ගේ හඬට අනුව යන්නේ මහත් වූ ආවාටයට පැමිණ වැටුණේ මරණයට පත්විය. (හේමපාල, 2002:143-145), (Kale,1969:69-71).

උක්ත කථාවෙන් ප්‍රබලයකු මර්දනය කිරීමට අවශ්‍ය නම් දුබලයන් රැසකගේ එකතුවෙන් ඔවුනොවුන් සතු හැකියාවන්, ශක්‍යතාවන් උපක්‍රමශීලීව උපයෝගි කොට ගෙන සිදුකළ හැකි බව ස්ඵුට කර දක්වයි. එබඳු සන්දර්භයන්ට අදාළව මනුෂ්‍යයන්ට වුව ද ප්‍රබලයන්ගෙන් සිදුවන්නා වූ විවිධ උපද්‍රවයන්හිදී එකිනෙකා එකතුව තම තමන්ගේ හැකියාවන් උපයෝගී කරගෙන එම ප්‍රබලයන් මර්දනය කිරීමටත් ප්‍රබලයන්ගෙන් වන්නා වූ උපද්‍රවයන් වළක්වා ගැනීමටත් හැකියාව පවතින බව තත් ජනකියමන තුළින් ගෙනහැර දැක්වීමට උත්සුක වී ඇති බව හඳුනාගත හැකිවෙයි.

''නරියා රජු වුණා වාගේ'' (ප්‍රේමදාස, 1995:242). මෙම ප්‍රකාශය තහවුරු කරන කථාව පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද කාණ්ඩයේ දහවැනි කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකිය (Kale,1969:55-56).

එක්තරා ප්‍රදේශයක චණ්ඩරාව නම් සිවලෙක් වාසය කළේය. දිනක් සාගින්නෙන් පෙළෙන ඔහු ආහාර සොයා ආසන්න නගරයකට යන්නේ එහි වෙසෙන බල්ලන් විසින් ලුහුබඳින ලද්දේ විය. ඔවුන්ගෙන් බේරීම සඳහා පළායන චණ්ඩරාව රජකයෙකුගේ නිවසෙහි තිබූ නිල් දිය බඳුනක වැටුණේය. එයින් කෙසේ හෝ මිදී නැවත වනයට ගිය විට එහි සිටි සිංහ, ව්‍යාඝ්‍රාදී සතුන් මෙම අමුතු පැහැයෙන් දිලෙන සත්වයා දැක බියටත් පුදුමයටත් පත් වී 'නුඹ වහන්සේ, කවරෙක් දැයි' විමසූහ. එවිට චණ්ඩරාව නම් සිවලා ඔවුන්ගේ ස්වභාවය දැන 'තොප පරිපාලනය සඳහාත් තොපගේ සත්කාර සම්මාන ලැබීම පිණිසත් තොප සතු රජෙකු නොමැති හෙයින් තොපහට රජවීම පිණිස ඉන්ද්‍ර දෙවියා විසින් මා මෙහි එවුයේය. එනිසා නහමක් බියවව් මාගේ බුජ බලයෙන් තොප රැකගන්නේ යැයි.' කීවේය. එවිට සිංහ, දිවි, ව්‍යාඝ්‍රාදී සියලු සත්වයෝ ඔහු වටා රැස්ව 'ස්වාමීනි, කුමක් ඉටු කළ යුතුදැයි අපට නියම කරන සේක්වායි' පැවසූහ. මෙහි දී සිවලා සිංහයා අමාත්‍යධුරයටත්, ව්‍යාඝ්‍රයා ශයන පාලකත්වයටත්, දිවියා තාම්බූල අධිකාරත්වයටත්, වෘකයා දොරටු පාලකත්වයටත් පත් කළ අතර ස්වකීය වර්ගය වූ සිවලුන්ට කිසිදු තනතුරක් නොදී කතා මාත්‍රයකදු නැතිව නෙරපන ලදහ. මෙසේ ඔහු රාජ්‍ය කරන කල්හි සිංහ, ව්‍යාඝ්‍රාදීන් දඩයම් කොට ඔහුට දෙන අතර ඔහු එය සියලුදෙනාට බෙදා දෙයි. මෙසේ කල් යන කල්හි දිනක් රාජ සභාවේ සිටින විට

ඈතින් සිවල් සමූහයකගේ නාදයක් චණ්ඩරාවට ශ්‍රවණය විය. එම ශබ්දය අසා ලොමු දැහැගත් සිරුර ඇත්තේ සිහසුනින් නැගිට ඉතා උස් හඬින් නාද කළේය. එම හඬ අසා සිංහ ව්‍යාඝ්‍රාදීහු කපටි සිවලා විසින් අප රවටන ලදැයි ලජ්ජා වී එකිනෙකා සාකච්ඡා කොට සිවලා මරණයට පත් කළහ (හේමපාල, 2002:119-120), (Kale,1969:55-56).

මෙම කතා පුවතින් පුද්ගලයන්ගේ වැරදි හැසිරීම ඔවුන්ගේ ම විනාශයට හේතු වන බව පසක් කරයි. එමෙන්ම අනුන් රැවටීම මගින් දිනෙක විවිධ කරදරයන්ට ලක්ව තමන්ට එහි ප්‍රතිවිපාකයන් විඳීමට සිදුවන බව ද පැහැදිලි කරයි. එහෙයින් සමාජයේ ජීවත් වන විට අනෙක් මිනිසුන් රවටමින් කටයුතු කිරීමට යාම තම විනාශයට හේතුවන බව පසක් කරන්නට තත් ජන කියමන නිර්මාණය වන්නට ඇත.

''නරියා දුනු ගැටේ කෑවා වාගේ'' (සුනන්ද, 2000:272). මෙම ප්‍රකාශය තහවුරු කරන කථාව හිතෝපදේශයේ මිත්‍රලාභයේ එන හයවන කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකිය (Kale, 1967:24-25).

කල්‍යාණ කටකයේ භෛරව නම් වැද්දෙක් වින්ධ්‍යා වනයට ගොස් මුවෙකු මරා ගෙනෙන විට ඌරෙකු දැක ඌරාට සිය දුන්නෙන් විද්දේය. ඌරා හී පහර වැදී දරුණු ගෙරවීම් කරමින් වැද්දාගේ අණ්ඩකෝෂ ප්‍රදේශයට පහර දී මැරී වැටෙයි. ඌරාගේ එම පහරින් වැද්දා ද ජීවිතක්ෂයට පත්විය. මොවුන් දෙදෙනාගේ පා ගැටීමෙන් අසල සිටි සර්පයෙකු ද මරණයට පත්විය. දීර්ඝසරාව නම් සිවලෙක් ආහාර සොයා ඇවිදින්නේ මැරුණු මිනිසා, මුවා, ඌරා සහ සර්පයා දැක, 'අහෝ මට ලොකු ආහාරයක් ලැබුණි. මෙයින් මට මාස ගණනක් ජීවත් විය හැකි' යැයි කල්පනා කොට පළමුව රස නැති නහර වැලින් කළ දුනුවැල කමියි සිතා එය හපන විට දුන්න ගැස්සී පපුවේ ඇනී මරණයට පත්විය (Kale, 1967:24-25).

දැඩි ලෝභය හා ආශාව නිසා මිනිසුන් මරණයට පත්වන ආකාරය හා නිස්කාරණයේ තම ජීවිතය අහිමි කරගන්නා ආකාරය මෙන්ම ලෝභයෙන් කටයුතු කරන්නට උත්සුක වන කවර අයෙකු වුව ද එයින් විපතට පත්වන ආකාරය මෙම කථාවෙන් පැහැදිලි වෙයි. ඒ

අනුව තමන්ගේ පරිභෝජනය සඳහා බොහෝ දෑ තිබිය දී ඒ පිළිබඳ නොතකා හැර ලෝභකමින් කිසිදු ආකාරයෙන් පරිභෝජනය කළ නොහැකි දේ භුක්ති විඳීමට යාම මගින් විපත්වලට මුහුණදීමට සිදුවන බව මෙයින් ගම්‍යමාන වෙයි. එබඳු ස්වභායෙන් යුතු මිනිසුන්ගේ ක්‍රියාකාරකම් හා හැසිරීම් උපහසායට ලක්කරවීම අරමුණු කොට ගෙන යථෝක්ත ජනකියමන නිර්මාණය වී ඇති බව විශද වේ.

සිංහල ජනශ්‍රැති පිළිබඳ විමසා බැලීමේදී විවිධ මිනිසුන්ගේ හැසිරීම් රටාවන් මූලික කරගෙන ඒ ඒ පුද්ගලයන් විසින් මුහුණදෙන ලද අවස්ථාවන් මගින් සමාජයට ලබාදෙන යම් යම් පණිවුඩ උපදේශ මූලික කරගෙන විවිධ ජනකියමන් නිර්මාණය වී ඇති ආකාරය ද හඳුනාගත හැකි වෙයි. එලෙස මනුෂ්‍යයන්ගේ ක්‍රියාකාරකම් මූලික කොට බිහිවූ ජනකියමන් සඳහා සංස්කෘත සාහිත්‍යාගත කථාන්දර බලපා ඇති ආකාරයට පහත එන ජනකියමන හා බැඳුණු කථාන්දරය කදිම නිදසුනකි.

''අහසේ මාළිගා තනනවා වාගේ (අහස් මාලිගා තනනවා වාගේ)'' (සුනන්ද, 2000:54). ''ආකාසේ මාළිගා තනනවා වාගේ'' (මංගලිකා, 2013:23). මෙයට සමාන අදහස් ඇති කථාන්දරයක් පඤ්චතන්ත්‍රයේ අපරීක්ෂිතකාරක කාණ්ඩයේ අටවැනි කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකිය (Kale, 1969:244-245).

කිසියම් නගරයක ස්වභාවකෘපණ නම් බ්‍රාහ්මණයෙක් වාසය කරයි. ඔහු සිඟමනෙන් ලබන ලද යව පිටිවලින් අනුභව කොට ඉතිරිය කළයක පුරවන ලදි. එම කළය බිත්තියෙහි එල්ලා ඊට යටින් යහනක් තබා එහි වැතිරී එම යව පිටි කළය දෙසම ඇසිපිය නොහෙළා බලා සිටී. ඉක්බිති කිසියම් රාත්‍රියක නිදාගත්තේ කල්පනා කරන්නට විය. 'මේ කළය යව පිටිවලින් පිරී ඇත. ඉදින් දුර්භික්ෂයක් ඇති වුවහොත් මෙයින් රුපියල් සියයක් ඉපදවිය හැක්කේය. අනතුරුව එම මුදලින් මා එළුවන් දෙදෙනෙක් ගතයුතු ය. ඉනික්බිති මාස හයෙන් පැටව් ලැබෙන නිසා ඔවුන් දෙදෙනාගෙන් එළු රැළක් ඇති වේ. අනතුරුව එළුවන්ගෙන් කොටසක් විකුණා බොහෝ එළදෙනුන් ගන්නෙමි. එළදෙනුන්ගෙන් කොටසක් විකුණා මී දෙනුන් ගන්නෙමි. මී දෙනුන්ගෙන් කොටසක් විකුණා වෙළඹුන් හා අශ්වයන් ගන්නෙමි.

ඔවුන් විකිණීමෙන් බොහෝ රන් මසු ලැබිය හැකිය. රන් මසු ලැබීමෙන් පසු විශාල මන්දිරයක් ඉදිකර ගත හැකි ය. අනතුරුව කිසියම් බමුණෙක් මගේ ගෙට පැමිණ සම්පූර්ණ වූ වයස ඇති රූප ශෝභාවෙන් යුත් කන්‍යාවක් සරණකර දෙයි. ඇයගෙන් මට පුත්‍රයෙක් වන්නේ ය. මම ඔහුට සෝමශර්ම යැයි නම තබන්නෙමි. අනතුරුව ඔහු ඇවිද යන වයසට පත් වූ පසු මම පොතක් ගෙන අස්හල පිටුපස හිඳගෙන ඔහුට උගන්වන්නෙමි. මේ අතර සෝමශර්ම මා දැක මවගේ ඇකයෙන් බැස අසුන්ගේ පා කුර වදින මානයෙන් මා වෙත පැමිණෙන්නේ ය. එවිට මම කෝපාවිෂ්ට වී බැමිණියට කියන්නෙමි. 'වහා දරුව ගනුව.' ගෙයි වැඩපළෙහි නියැළෙන ඇය මගේ වචනය නො අසයි. මම නැගිට ඇයට පයින් පහර දෙන්නෙමි.' මෙසේ කල්පනා කරමින් සිටි ඔහු විසින් එසේම පා පහර දෙන්නේ ඒ කළය බිඳිණි. පිටි විසිරී ගියේ ය (හේමපාල, 2002:368-370), (Kale, 1969:244-245).

ඉහත කථාවෙන් තමන් සතුව පැවති අල්ප වස්තුව මුල්කොටගෙන ඒ තුළින් විශාල ධනයක් උපයාගෙන කටයුතු කිරීමට සිහින දැකීමත් එසේ සිහින දැකීමෙන් තමන් සිටින තත්ත්වය හා අවස්ථාව පිළිබඳ මනාව වටහා නොගෙන කටයුතු කිරීම මගින් මැවූ සිහින සියල්ල විනාශයට පත්ව ආකාරයත් විශද කර දක්වයි. විශේෂයෙන් තමන්ට කළ නොහැකි දේ පිළිබඳ හිස් කල්පනා බොරු ප්‍රාර්ථනා මැවීම තමන් සන්තකයේ ඇති දෑ විනාශවීමට හේතුවන බව වැඩිදුරටත් ගෙනහැර දක්වයි. එවැනි කළ නොහැකි දෑ පිළිබඳ හිස් කල්පනාවන් ඇති කරගෙන කටයුතු කරන පුද්ගලයන් සඳය උපහාසයට ලක්කරමින් යථොක්ත ජනකියමන ජනශ්‍රැතියට එකතු වී ඇති අකාරය හඳුනාගත හැකි වෙයි.

එමෙන්ම ඇතැම් පුද්ගලයන් තම හිතෛශීන් විශ්වාස කොට කටයුතු කිරීමට ගොස් එම හිතෛශීන් තමන්ව රැවටීම නිසා විවිධ අපහසුතාවන්ට හා පීඩාවන්ට පත්වන්නට සිදුවන අවස්ථා බොහෝවිට සමාජයෙන් අසන්නට දකින්නට ලැබේ. එවැනි පුද්ගලයන් විෂයයෙහි ඒ ආකාරයෙන්ම කටයුතු කළයුතු බව කියවෙන ජනකියමනක් වශයෙන් 'ඇදේට ඇදක්ම කළ යුතුය' (සුනන්ද, 2000:72). 'ඇදේට ඇදක්ම කළ යුතුලු' (මංගලිකා, 2013:26). යන්න හඳුනාගත හැකිවෙයි.

මෙයට සමාන අදහස් ඇති කථාන්දරයක් පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද කාණ්ඩයේ විසිඑක්වැනි කථාවේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකිය (Kale, 1969:88-89).

''කිසියම් නුවරක ජීර්ණධන නම් වෙළඳ පුත්‍රයෙක් වෙයි. ඔහු ධන විනාශය හේතුවෙන් වෙනත් දේශයකට යන්නට සූදානම් විය. ඔහුගේ ගෙදර ඝන ලෝහයෙන් කරන ලද ආදි පුරුෂයන් විසින් සපයන ලද තරාදියක් විය. එය කිසියම් සිටුවරයෙකුගේ ගෘහයෙහි ආරක්‍ෂාව සඳහා තබා විදේශයකට පිටත්ව ගියේ ය. ඊට පසු බෝහෝ කාලයක් කැමති පරිදි විදේශයන්හි සැරිසරා නැවත සිය නුවරට පැමිණ ඒ සිටාණන්ට කීවේ ය. 'පින්වත් සිටුතුමනි, ආරක්‍ෂාව පිණිස තබා යන ලද මාගේ ඒ තරාදිය දෙනු ලැබේවා යි.' එවිට එම සිටුවරයා පින්වත, ඔබට අයත් එම තරාදිය නැත. මීයන් විසින් කන ලද්දේ යැයි පැවසී ය. එවිට ජීර්ණධන තෙමේ, 'පින්වත් සිටුතුමනි, මාගේ තරාදිය මීයන් විසින් කන ලද්දේ නම් ඔබගේ දෝෂයක් නැත. මේ සසර මෙබඳුමැයි මේ සසර නිත්‍ය වූ කිසිවක් නැත. අනෙකක් ඇත. මම ගඟෙහි නෑම පිණිස යමි. එහෙයින් ඔබතුමා ධනදේව නම් මේ ඔබගේ දරුවා නාන උපකරණ ගත් අත් ඇතිව මා සමඟ එවනු මැනවැයි' කීවේ ය. ඒ සිටුවරයාද තමන් කළ සොරකම නිසා බියෙන් ඔහුට බිය වූයේ තම පුතාට 'දරුව, තාගේ මේ කුඩා පියා නෑම පිණිස ගඟට යන්නේ ය. එහෙයින් නෑම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ගෙන මොහු සමඟ පිටත්ව යනු ලැබේවායි' කීවේ ය.

අනතුරුව මේ වෙළඳ පුත්‍රයා සතුටු සිත් ඇත්තේ නෑම සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍ය ගෙන ඒ ආගන්තුකයා සමඟ පිටත් විය. එසේ කරන ලද කල්හි වෙළඳ තෙමේ ස්නානය කොට ඒ බාලකයා ගංගා ගුහාවක බහා එහි දොර මහ ගලකින් වසා වහා ගෙට පැමිණියේ ඒ වෙළෙන්දා විසින් 'පින්වත් ආගන්තුකය, නුඹ සමඟ ගඟට ඒ මාගේ දරුවා කොහි දැයි කියනු ලැබේවා යි.' විචාරණ ලදි. එවිට ඒ ආගන්තුකයා ගං ඉවුරේ සිටි ඒ දරුවා උකුසකු විසින් පැහැරගෙන යන ලදැයි කීයේය. එවිට සිටුතුමා 'අසත්‍යවාදිය, කිසිතැනෙක උකුස්සෙකු විසින් ළදරුවෙකු ගෙනයන්නට කිම සමත් වෙයි ද? එහෙයින් මාගේ පුත්‍රයා ගෙනවිත් දෙව. එසේ නොකළහොත් රජුට දන්වන්නෙමි. යි' කීවේ ය. ඒ ආගන්තුකයා 'පින්වත් සත්‍යවාදිය, යම්සේ උකුස්සෙක් ළදරුවෙකු

ගෙන නො යයි ද එසේම මීයෝ ද ලෝහබරින් නිමවන ලද තරාදියක් නොකති. එහෙයින් ඉදින් දරුවාගෙන් ප්‍රයෝජනයක් වේ නම් මාගේ තරාදිය නැවත දෙන්නැයි' කීවේ ය.

මෙසේ ඔවුහු දෙදෙනාම විවාද කරන්නාහු රජගෙට ගියහ. එහි දි සිටුතෙමේ උස්හඬින් කීවේය. 'පින්වත්නි, මේ සොරා විසින් මාගේ ළදරුවා පැහැරගන්නා ලදි.' අනතුරුව විනිශ්චයකාරයෝ 'පින්වත, සිටු පුත්‍රයා නැවත දෙනු ලැබේවා. යි' ඒ ආගන්තුකයාට කීහ. ඒ ආගන්තුකයා 'කුමක් කරම් ද, උකුස්සෙකු විසින් මා බලා සිටිනා විට ගං ඉවුරෙන් ළදරුවා පැහැරගෙන යන ලදි. යි කීවේ ය. එය අසා ඒ විනිශ්චයකාරයෝ කීහ. 'පින්වත, නුඹ විසින් ඇත්තක් නොකියන ලදි. උකුස්සෙක් දරුවෙකු ගෙන යන්නට කිම සමත් වෙයි ද? ඒ ආගන්තුකයා කීයේ ය. පිනවත්නි, මගේ වචනයත් අසන්න යැයි 'යම් තැනක, මීයෝ ලෝහ දහසක් වටිනා තරාදියක් කත් ද රජතුමනි, එහි උකුස්සෙක් ළමයෙකු ගෙන යන්නේයි. මෙහි සැකයක් නැතැයි' කීවේ ය.

ඔවුහු මෙය කෙසේදැ'යි විචාළහ. අනතුරුව සිටුවරයා සභිකයන්ගේ ඉදිරියේ මුල පටන් සියලු ප්‍රවෘත්තිය දැන්වී ය. ඉක්බිති ඒ විනිශ්චකාරයන් විසින් සිනාසී ඔවුනොවුන්ට කරුණු අවබෝධ කොට දී තරාදිය ද ළදරුවා ද දීමෙන් ඔවුහු දෙදෙනාම සතුටු කරන ලදහ.'' (Kale, 1969:88-89).

උක්ත කථාවෙන් තම මිත්‍රයා තමන්ව රැවටුවා සේම මිත්‍රයා ද රවටා තමාට අයත් විය යුතු දෑ නැවත ලබාගැනීමට ජීර්ණධන තෙමේ කටයුතු කරයි. එහෙයින් සමාජයේ සිදුවන එවැනි සිදුවීම් මුල්කොට යථොක්ත ජනකියමන ජනවහරට සංස්කෘත සාහිත්‍යයේ ද අභාසය ලබමින් එකතුවන්නට ඇති බව සඳහන් කළ හැකි වේ. එමෙන්ම එවැනිම අදහසක් ඇති ශ්ලෝක පාඨයක් ප්‍රත්‍ය ශතකයේ ද අන්තර්ගත වෙයි. එය මෙසේය.

ඍජුකං ඍජුකං චෛව වංකං වංකමේව ච

ස්වර්ණං තාම්‍ර ඵලං චෛව පුත්‍රෝ භවති වානරඃ[2] (ගම්ලත්, 1997: 39).

ඍජුකමට ඍජුකම ද වංකකමට වංකකම ද යෙදිය යුතුය. කෙසේ ද? ස්වර්ණ ඵලය තඹ වීය යයි කීවහුට පුත්‍රයා වානර වී යැයි කීවාක් මෙනි. මෙයින් අවංක තැනැත්තාට වංකකම් නොකළ යුතු බවත් වංක මිනිසාට වංකකමෙන් ම පිළිතුරු සැපයිය යුතු බවත් කියවේ. පෙර සඳහන් කළ පරිදි එබඳු සන්දර්භයන්ට අදාළව උක්ත ජනකියමන ජනවහරට එක් වී ඇත.

පුරාණ ජනයා හා පරිසරය අතර පැවතියේ මනා සම්බන්ධතාවකි. ඔවූහු පරිසරයට ආදරය කළහ. එය මැනවින් ආරක්ෂා කරගැනීමට උත්සුක වූහ. තම ජීවිතයත් පරිසරයත් එක හා සමානව සලකමින් කටයුතු කළහ. එනිසාම පරිසරයේ සිදුවන සිදුවීම් හා එහි වැදගත් ම අංගයක් වන තුරුලතා කෙරෙහි මිනිස්සු මහත් ළෙන්ගතුකමකින් කටයුතු කළහ. එනිසාම එම පරිසරයේ සිදුවන සිදුවීම් එහි ක්‍රියාකාරිත්වය සමීපව සිට දකින්නටත් වෘක්ෂලතාවන්හි ස්වභාවය ඒවායෙහි වටිනාකම් පිළිබඳ වටහාගන්නටත් ඔවුනට හැකියාව ලැබිණ. ඒ අනුව පරිසරයේ සිදුවන විවිධ සිදුවීම් හා වෘක්ෂලතා සම්බන්ධව ඔවුන් සතුව පැවති මනා අවබෝධයත් මුල්කොට ගෙන විවිධ ජනශ්‍රැති නිර්මාණය වී ඇති ආකාරය දැකගත හැකිය. එම ජනශ්‍රැති නිර්මාණයෙහිලා සංස්කෘත සාහිත්‍යයෙහි අන්තර්ගත විවිධ සිදුවීම් හා ප්‍රකාශයන් බලපා ඇති ආකාරය හඳුනාගත හැකි වෙයි. එයට නිදසුන් සපයන ජනශ්‍රැතීන් කිහිපයක් පහත දැක්වේ.

'ගස් නැති රටේ එරඬු ගහත් ගහක්ලු' (ප්‍රේමදාස, 1995:235). 'ගස් නැති රටේ එරඬු ගසුත් ගස්ය' (සුනන්ද, 2000:xv). මෙම ප්‍රකාශය තහවුරු කරන ප්‍රකාශයක් හිතෝපදේශයේ මිත්‍රලාභයේ එන 70 වැනි ශ්ලෝකයේ අන්තර්ගතය තුළින් හඳුනාගත හැකිය (Kale, 1967:14).

යත්‍ර විද්වජ්ජනෝ නාස්ති ශ්ලාඝ්‍යස්තත්‍රාල්පධීරපි

නිරස්තපාදපේ දේශේ එරණ්ඩො'පි ද්‍රැමායතෙ[3] (Kale, 1967:14).

යම් ස්ථානයක විද්වද් ජනයා නොමැති ද එහි අල්ප බුද්ධිය ඇති තැනැත්තා පිදීමට පාත්‍රවේ. ගස් නැති රටේ එරඬු ගසත් ගසක් වශයෙන් සලකයි. මෙයින් කියවෙන්නේ උගතුන් නොමැති

ස්ථානයන්හි අල්ප බුද්ධිය ඇති පුද්ගලයන් උගතුන් බුද්ධිමතුන් සේ ගෞරවයට සැලකිල්ලට ලක්වන බවයි. එමෙන්ම ශක්ති සම්පන්න උසස් ස්වභාවයේ ගස් නොමැති ප්‍රදේශයන්හි එරඬු ගස් ද ඉතා උසස් ශක්තිමත් ගස් වශයෙන් සලකන බවයි. ඒ අනුව උගතුන් බුද්ධිමතුන් නොමැති තැන අල්ප බුද්ධිය ඇත්තවුන් ගෞරවයට ලක්වන අවස්ථාවන් හා උසස් ශක්තිමත් දැව නොමැති තැන්වල උසස් බවෙන් ශක්තියෙන් අඩු දැව ආදිය භාවිත කිරීම උපහාසයට ලක්කරමින් උක්ත ජනකියමන නිර්මාණය වී ඇති බව හඳුනාගත හැකි වෙයි.

'උණ බට කෙසෙල් පූදින්නේ විනාසෙට' (ප්‍රේමදාස, 1995:235). 'උණ බට කෙහෙල් පූදින්නේ විනාසෙට' (සුනන්ද, 2000:101). මෙම ජනකියමන ද පරිසරයේ සිදුවන්නා වූ සාමාන්‍ය සිදුවීමක් මුල්කොට බිහි වී ඇති කියමනකි. එයට දෙස් දෙන්නා වූ ශ්ලෝක පාඨයක් ප්‍රත්‍ය ශතකයේ මෙලෙස සඳහන් වේ.

වේණුර්ණලී කර්කටකාශ්ච රම්භා- විනාශ කාලේ ඵලමුද්වහන්ති

ඒවං නරාණාං මති විප්‍රකාරාත්- විනාශ කාලේ විපරීත බුද්ධිඃ[4]

(ගම්ලත්, 1997: 13).

උණ, බට, කෙසෙල් පීදුණ පසු විනාශ වී යයි. කකුළුවෝ බිජු දැමීමෙන් ම වැනසෙති. මේ ආකාරයෙන් ම මනුෂ්‍යයෝ ද සිය විනාශ කාලය පැමිණි කල්හි සිහිය වෙනස් වීමෙන් බුද්ධිය විපරීත වී හැසිරෙති. මෙම ප්‍රකාශයෙන් පැහැදිලි කරන්නේ ඇතැම් ගස්වල පීදීමත් සතුන්ගේ බිත්තර හටගැනීමත් විනාශ කාලය පැමිණි විට සිදුවන බවයි. එලෙසම මිනිසුන්ගේ විනාශය පැමිණි විට ද විපරීත ස්වභාවයෙන් හැසිරෙන බවයි. එවැනි සන්දර්භයන් තුළ විශේෂ වශයෙන් මිනිසුන්ගේ හැසිරීම් උපහාසයට ලක්කිරිම සඳහා උක්ත ජනකියමන නිර්මාණය වී ඇති ආකාරය හඳුනාගත හැකිවේ. ඒවා

'අත්තික්කා මල් නැතිවා වාගේ', 'දිඹුලෙන් මල් නො ලද හැකි සේ' (ප්‍රේමදාස, 1995:235). 'අත්තික්කා ගහේ මල් හටගත්තා වගෙයි', 'අට්ටික්කා ගහේ මල් පිපුණා වගේ' (සුනන්ද, 2000:09). 'අට්ටික්කා ගහේ මල් පිපුණා වගෙයි' (මංගලිකා, 2013:19). මෙම ජනකියමන ද පරිසරයේ සිදුවන්නා වූ සාමාන්‍ය සිදුවීමක් මුල්කොට බිහි වී ඇති

කියමනකි. එයට දෙස් දෙන්නා වූ ශ්ලෝක පාඨයක් ප්‍රත්‍ය ශතකයේ මෙලෙස සඳහන් වේ.

ඖදුම්බරභවං පුෂ්පං ශ්වේතවර්ණශ්ච කාකයෝඃ

මත්ස්‍යපාදං ජලේ පශ්‍යෙත් නාරි චිත්තං න විශ්වසේත්[5]
(ගම්ලත්, 1997ඃ 14).

දිඹුල් මල් ද සුදු කපුටන් ද දියෙහි මත්ස්‍යයන්ගේ පිය සටහන් ද යන මේවා යමෙකු දුටුවේ යැයි කී විට විශ්වාස කරතත් ස්ත්‍රීන්ගේ සිත විශ්වාස කළ නොහැක්කේය. මෙම ප්‍රකාශය ස්ත්‍රීන් ගර්හා කිරීමට හා ඔවුන් මර්දනය කොට වහල් භාවයේ තබාගැනීමට කියන ලද ප්‍රතිගාමී පුරුෂෝත්තම්වාදී ප්‍රකාශයක් බව ගම්ලත් මහතා පවසයි (ගම්ලත්, 1997ඃ 14). විශේෂයෙන් අට්ටික්කා මල් හට නොගන්නා ගස් විශේෂයක් වශයෙන් සැලකේ. ඒ අනුව උක්ත ජනකියමන කිසිසේත් සිදුවිය නොහැකි දෙයක් සිදුවීම මුලකොට ගෙන නිර්මාණය කරන ලද්දක් බව පැහැදිලි වෙයි.

ජනශ්‍රැති නිර්මාණය කිරීමේදී තත් ජනයාට තම ගෘහයන්හි නිරන්තරයෙන් භාවිත කරන ලද භාණ්ඩයන්හි ස්වභාවය පිළිබඳ අත්දැකීම් මුල්කොට නිර්මාණය කරන ලද ජනකියමන් ද දක්නට ලැබේ. එවැනි ජනකියමන් නිර්මාණයවීම සඳහා ද සංස්කෘත සාහිත්‍යයේ අන්තර්ගත ඇතැම් උපදේශාත්මක පාඨ බලපා ඇති ආකාරය හඳුනාගත හැකිවෙයි.

'පිරුණු කළේ දිය නො සැලේ, අඩු කළේ දිය සෙලවේ' (ප්‍රේමදාස, 1995ඃ149). 'පිරුණු කළේ දිය නොසැලේ' (මංගලිකා, 2013ඃ109), (සුනන්ද, 2000ඃ323). මෙම ප්‍රකාශයට තුඩු දී ඇති ශ්ලෝක පාඨයක් ප්‍රත්‍ය ශතකයේ මෙලෙස සඳහන් වේ.

අර්ධෝ ඝටෝ ඝෝෂණමේත්‍යදර්භං- සම්පූර්ණ කුම්භෝ න කරෝති ශබ්දම්

ප්‍රහීණවිද්‍යඃ ප්‍රකරෝති ගර්වං- සම්පූර්ණ විද්‍යෝ න කරෝති ගර්වම්[6] (ගම්ලත්, 1997ඃ 34).

අඩු කළයෙහි ජලය සැලේ. එයින් හඬ නගී. පිරුණු කළයෙහි දිය නො සැලේ. එහෙයින් ඉන් හඬ ද නො නැගේ. එමෙන් ම අඩු දැනීමක් ඇත්තේ උඩඟු බවට පත්වේ. සම්පූර්ණ දැනුමෙන් යුතු

තැනැත්තේ උඩඟු බවින් තොරය. මෙම ප්‍රකාශයෙන් ජනිත කරන්නේ ජලයෙන් මනාව පිරී ඇති කළයකින් ශබ්දය නො නැගෙන්නා සේ පුද්ගලයන් සමාජය පිළිබඳ ජීවිතය පිළිබඳ එමෙන්ම තම තමන් උගත් ශාස්ත්‍රය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත නම් එවැනි පුද්ගලයන් කිසිවෙකුට අහංකාරකමින් උඩඟු බවින් යුක්තව කටයුතු නොකරන බවයි. එබඳු පුද්ගලයන්ගේ සහ වස්තුන්හි ස්වභාවය ප්‍රකට කිරීම පිණිස උක්ත ජනකියමන සංස්කෘත සාහිත්‍යාශ්‍රයෙන් නිර්මාණය කරගෙන ඇති බව පැහැදිලි වෙයි.

**සමාලෝචනය**

ජනශ්‍රැති නිර්මාණය වීමෙහිලා පූර්වතර ජනයාගේ ජන විඥානය තුළ රැඳී තිබූ විවිධ ජනකථාවන් හා ඔවුන්ගේ ජීවන අත්දැකීම් මගින් ලත් පරිචය හේතු වී ඇති බව පසක් කරගත හැකිවෙයි. වෙසෙසින් සිංහල ජනශ්‍රැතිය පිළිබඳ විමසීමේදී පූර්ව ජනයා තමන් ලත් අත්දැකීම් හා විවිධ සාහිත්‍යාශ්‍රයෙන් ලද බහුශ්‍රැතභාවය උපයෝගී කොටගෙන ඒ ඒ සන්දර්භයන්ට අදාළව ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, උපමා හා ඉඟි වැකි ආදිය නිර්මාණය කරගෙන ඇති බව හඳුනාගත හැකිය. එමගින් තත් ජන සමාජයේ ජීවත් වූ සහ ජීවත් වන්නවුන්ගේ ජීවන තොරතුරු ද විශද කරගැනීමට අවස්ථාව උදාවෙයි.

විශේෂයෙන් සිංහල ජන වහරේ එන එම ජනකියමන් නිර්මාණය කරගැනීමෙහි ලා විවිධ භාෂාවන් කථා කරන ජන කොට්ඨාශයන්ට අයත් සිදුවීම් හා සාහිත්‍යයන්හි අන්තර්ගත කථාන්දර හා ප්‍රකාශයන් ඉවහල් කරගෙන ඇතිවාට සැකයක් නැත. ඒ අනුව උක්ත දක්වන ලද නිදර්ශනයන් මගින් සිංහල ජනශ්‍රැතියෙහි එන ප්‍රකට ජනකියමන් නිර්මාණය කරගැනීමෙහිලා සංස්කෘත සාහිත්‍ය බලපා ඇත්තේ කෙසේ දැයි මොනවට ස්ඵුට වේ. එමගින් සිංහල ජනශ්‍රැතිය විෂයෙහි සංස්කෘත සාහිත්‍යයේ බලපෑම ප්‍රකට කරන්නාක් මෙන්ම සංස්කෘත සාහිත්‍යාගත කථාන්දර, සිදුවීම් හා උපදේශාත්මක ශ්ලෝක පාඨයන් පිළිබඳ තත්කාලීන ජනතාවගේ අවබෝධය කොතෙක් ද යන්න මැනවින් වටහාගත හැකි වෙයි. එහෙයින් මෙම අධ්‍යයනය ජනශ්‍රැතිය විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විවිධ අනු ප්‍රභේදයන් යටතේ දීර්ඝ වශයෙන් විමර්ශනය කරන්නෙකුට මහත් පිටුබලයක් සපයනු නො අනුමානය.

## සටහන්

1. සුනන්ද මහේන්ද්‍ර මහතාගේ ජනකියමන් පොත නම් කෘතියෙහි තත් කියමන සඳහන් වන අතර එය ඊසෝප් උපමා කතාවකින් බිහි වී ඇති බව සඳහන් කරයි.
2. ऋजुकं ऋजुकं चैव वंकं वंकमेव च ।- स्वर्णं ताम्र फलं चैव पुत्रो भवति वानरः ॥
3. यत्र विद्वज्जनो नस्ति श्लाघ्यस्तत्राल्मधीरपि । - निरस्तपादपे देशे एरण्डोऽपि द्रुमायते ॥ ७० ॥
4. वेणुर्नली कर्कटकाश्च रम्भा विनाश काले फलमुद्वहन्ति । एवं नराणां मति विप्रकारात् विनाश काले विपरीत बुद्धिः ॥
5. औदुम्बरभवं पुष्पं श्वेतवर्णश्च काकयोः ।- मत्स्यपादं जले पश्येत् नारि चित्तं न विश्वसेत् ॥
6. अर्धोघटो घोषणमेत्यदर्भं सम्पूर्ण कुम्भो न करोति शब्दम् । प्रहीणविद्यः प्रकरोति गर्वं सम्पूर्ण विद्यो न करोति गर्वम् ॥

## මූලාශ්‍රය ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

පඤ්චතන්ත්‍රය, (ශ්‍රී සුමංගල අභිනව ව්‍යාඛ්‍යාව, මිත්‍රභේද කථා සංග්‍රහය), (පරි.) (1990). පහමුණේ ශ්‍රී සුමංගල හිමි. කොළඹ: සමයවර්ධන.

පඤ්චතන්ත්‍රය, (පරි.) (2002). හේමපාල මුණිදාස. කොළඹ: ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

ප්‍රත්‍ය ශතකය, (පරි.) (1997). සුචරිත ගම්ලත්. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හිතෝපදේශය, (පරි.), (වර්ෂයක් සඳහන් නොවේ), හල්දොල විමලකිත්ති හිමි. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

### ද්විතීයික මූලාශ්‍රය

අලවත්තගේ, ප්‍රේමදාස ශ්‍රී. (1995). සිංහල ප්‍රස්තාව පිරුළු සාහිත්‍යය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මහේන්ද්‍ර, සුනන්ද. (2000). ජනකියමන් පොත. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රණසිංහ, මංගලිකා. (2013). ප්‍රස්තාව පිරුළු සහ ඉඟි වැකි. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Kale, M.R. (ed.) (1967). Hitopadeśa of Nārāyaṇa, Bombay: Gopal Narayana & Co.

Kale, M.R. (ed.) (1969). Pañcatantra of Viṣṇuśarman, Delhi: Motilal Banarsidass.